# ප්‍රසම්පාදන දැන්වීමයි

# කැලණිය විශ්වවිද්‍යාලයේ දළුගම පිහිටි ප්‍රධාන පරිශ්‍රය, රාගම වෛද්‍ය පීඨය හා බාහිර පරිශ්‍ර (දළුගම පරිශ්‍රය හා රාගම වෛද්‍ය පීඨය හැර) සඳහා ආරක්ෂක සේවාව සැපයීම -2026

2026 වර්ෂය සඳහා පහත සඳහන් පරිශ්‍රයන් වෙත ආරක්ෂක සේවාව සැපයීමට සුදුසුකම් ලත් ආයතනවලින් ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ප්‍රසම්පාදන අංකය | විස්තරය | ලංසු බැඳුම්කර (රු.) | ටෙන්ඩර් ගාස්තු (රු.) | ටෙන්ඩර් පත් වලංගු කාලය (දින) |
|---|---|---|---|---|---|
| 01 | UK/GA/GA7/SS/DAL/04 (කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රය-දළුගම) | පෞද්ගලික ආරක්ෂක සේවාව සැපයීම-2026 | 1,290,000.00 | 20,000.00 | 2026.01.16 දින තෙක් |
| 02 | UK/GA/GA7/SS/RAG/04 (වෛද්‍ය පීඨය, රාගම පරිශ්‍රය) | | 720,000.00 | 12,500.00 | 2026.01.16 දින තෙක් |
| 03 | UK/GA/GA7/SS/EXT/04 (විශ්වවිද්‍යාලයේ දළුගම පරිශ්‍රය හා රාගම වෛද්‍ය පීඨය හැර විශ්වවිද්‍යාලයට අයත් සියලුම බාහිර පරිශ්‍ර) | | 850,000.00 | 12,500.00 | 2026.01.16 දින තෙක් |

**<u>යෝග්‍යතා</u>**

1. රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනවල ආරක්ෂක සේවා සැපයීම පිළිබඳ ව ව්‍යාපාර ලියාපදිංචියේ සිට **<u>අවම වසර 5කට නොඅඩු</u>** සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ අසාදුලේඛනගත (Blacklist) නොවූ ආයතනයක් විය යුතු ය.
2. ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක අංශයේ ලියාපදිංචි වාර්ෂික වලංගු බලපත්‍රයක් තිබිය යුතු ය.
3. **<u>2024.03.31 දිනට පෙර ආසන්න වසර තුනකදී</u>** ආරක්ෂක සේවාව සැපයීම තුළින් ලැබූ සාමාන්‍ය මුලු පිරිවැටුම (Average Annual Turnover) **<u>පහත අගයන්ට වඩා වැඩි විය යුතු ය.</u>**

| අනු අංකය | ප්‍රසම්පාදන අංකය | සාමාන්‍ය මුලු පිරිවැටුම (රු.) |
|---|---|---|
| 01 | UK/GA/GA7/SS/DAL/04 (කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රය-දළුගම) | මිලියන 129 |
| 02 | UK/GA/GA7/SS/RAG/04 (වෛද්‍ය පීඨය, රාගම පරිශ්‍රය) | මිලියන 72 |
| 03 | UK/GA/GA7/SS/EXT/04 (විශ්වවිද්‍යාලයේ දළුගම පරිශ්‍රය හා රාගම වෛද්‍ය පීඨය හැර විශ්වවිද්‍යාලයට අයත් සියලුම බාහිර පරිශ්‍ර) | මිලියන 85 |

සෑම ලංසු පත්‍රයක් සමඟ ම ඉහතින් දක්වා ඇති වටිනාකම සහ වලංගු කාලය සහිත **<u>ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති වාණිජ බැංකුවකින්</u>** **උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය** නමට ලබාගත් ලංසු බැඳුම්කරයක් හෝ මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපතේ මුල් පිටපත අමුණා තිබිය යුතු ය.

ලංසු ඉදිරිපත් කරන ආයතනවලට ඉහත සඳහන් ටෙන්ඩර් තුනටම හෝ එක් ටෙන්ඩරයකට හෝ ටෙන්ඩර් දෙකකට ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන (0112903116 සහ 0112903117) අමතා ලබාගත හැකි අතර ලංසුපත් වැඩකරන දිනයන්හි දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.
ඉහත සේවා සැපයීමට අදාළ ස්ථානමය පරීක්ෂාව 2025.09.29 සිට 2025.10.15 දින දක්වා රාජකාරී දිනයන් තුළ **පෙ.ව. 09.00 සිට ප.ව. 02.00 දක්වා** සිදු කළ හැක. මේ හා සම්බන්ධ පූර්ව ලංසු රැස්වීමක් (Pre-bid meeting) **2025.10.02 දින ප.ව. 2.00ට විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ දෙවන මහලේ පීඨාධිපති කමිටු රැස්වීම් ශාලාවේ දී** පැවැත්වෙන අතර, ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සියලුම ආයතන මෙම රැස්වීමට සහභාගිවීම අත්‍යාවශ්‍ය වේ.

සියලුම ලංසුපත් සිංහල භාෂාවෙන් ලබා ගත හැකි අතර මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2025.09.29 සිට 2025.10.15 දක්වා රාජකාරී දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 02.00 දක්වා තම ආයතනයේ ලිපි ශීර්ෂයක ලියූ ලිඛිත ඉල්ලීමක් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ආපසු නොගෙවනු ලබන ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ගෙවා ලබාගත් ලදුපතක් ද සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී- සාමාන්‍ය පාලන වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසුපත ලබාගත හැකි ය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසුපත් එක් එක් පරිශ්‍ර සඳහා මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන වෙනම සඳහන් කළ ලියුම් කවරවල දමා මුද්‍රා තබා නැවතත් එම ලියුම් කවර 2 තනි ලියුම් කවරයක බහා මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙළවර **"කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ ආරක්ෂක සේවා සැපයීම - 2026, රාගම වෛද්‍ය පීඨ පරිශ්‍රයේ ආරක්ෂක සේවා සැපයීම - 2026, විශ්වවිද්‍යාලයේ දළුගම පරිශ්‍රය හා බාහිර පරිශ්‍ර සඳහා ආරක්ෂක සේවා සැපයීම- 2026 "** ලෙස පැහැදිලි ව සඳහන් කර මුද්‍රා තබන ලද ලංසුපත් **2025.10.16 දින ප.ව. 10.00ට ප්‍රථම කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පාලන අංශයේ තිබෙන ලේඛනයේ තම ආයතනයේ නම හා ඊට අදාළ තොරතුරු ලබාදීමෙන් තහවුරු කළ පසු පරිපාලන ගොඩනැගිල්ලේ දෙවන මහලෙහි ලේඛකාධිකාරී කාර්යාලය ඉදිරිපිට තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ සාමාන්‍ය පාලන හෝ ඔහුගේ/ ඇයගේ නියෝජිතයෙකු ඉදිරියේදී බහාලිය යුතුය.** ප්‍රමාද වී ලැබෙන ලංසු බාරගනු නොලැබේ.

ලංසු බාරගැනීම අවසන් වූ වහා ම ඒවා **විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ දෙවන මහලේ පීඨාධිපති කමිටු රැස්වීම් ශාලාවේ දී** විවෘත කරන අතර එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔහුගෙන් යථා පරිදි බලයලත් නිලධාරියෙකුට සහභාගී විය හැකි ය.

ඉහත ටෙන්ඩර්වලට අදාළ සියලු තොරතුරු ලංසු අයදුම්පතෙහි දක්වා ඇත.

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය අවසාන තීරණය වේ.

මෙම පුවත්පත් දැන්වීම විශ්වවිද්‍යාලයේ www.kln.ac.lk යන වෙබ් අඩවියේ මහජනතාවට දැනගැනීම පිණිස පළකර ඇති අතර විශ්වවිද්‍යාලයීය පරිපාලනයෙන් බැහැර ව රට තුළ ඇති විය හැකි හදිසි අවස්ථාවන් හේතුවෙන් ඉහත සඳහන් දිනයන්වල යම් සංශෝධනයක් කිරීමට සිදුවුවහොත් ඒ පිළිබඳවද විස්තර ඉහත සඳහන් වෙබ් අඩවිය මඟින් දැනුම් දෙනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කැලණිය විශ්වවිද්‍යාලය,
නො. 218, නුවර පාර,
දළුගම, කැලණිය.
2025.09.26